ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2028/21 - 2017 ජූලි මස 19 වැනි බදාදා - 2017.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* :- KOT/LND/ACQVI/01/72
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* :- 4-3/5/2015/CEB/201

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොස්මෝදර ග්‍රාම නිලධාරි වසමේ කොස්මෝදර ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 45හි පත්‍ර 117 හි අතිරේක අංක 89හි කැබලි අංක 2297, 2298 හා 2299 වශයෙන් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0839ක් වූ සම්බෝධිවත්ත නමැති ඉඩම් කැබලි වලට මායිම් -

**1. කැබලි අංක 2297- ඉඩමේ නම: සම්බෝධිවත්ත; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: සම්බෝධි භාරකාර මණ්ඩලය, අංක 09A, ක්ලෝසන්බර්ග් පාර, මාගල්ල, ගාල්ල; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.0155.**

*උතුරට*: කැබලි අංක 742 1/2 සහ 331; *නැගෙනහිරට*: කැබලි අංක 742 1/2, 2298 සහ 331; *දකුණට*: කැබලි අංක 331; *බටහිරට*: කැබලි අංක 331.

**02. කැබලි අංක 2298- ඉඩමේ නම: සම්බෝධිවත්ත; හිමිකම් කියන්නා: සම්බෝධි භාරකාර මණ්ඩලය, අංක 09A, ක්ලෝසන්බර්ග් පාර, මාගල්ල, ගාල්ල; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.0066.**

*උතුරට*: කැබලි අංක 742 1/2; *නැගෙනහිරට*: කැබලි අංක 742 1/2, සහ 331; *දකුණට*: කැබලි අංක 331; *බටහිරට*: කැබලි අංක 2297 සහ 742 1/2.

**03. කැබලි අංක 2299- ඉඩමේ නම: සම්බෝධිවත්ත; හිමිකම් කියන්නා: සම්බෝධි භාරකාර මණ්ඩලය, අංක 09A, ක්ලෝසන්බර්ග් පාර, මාගල්ල, ගාල්ල; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.0618.**

*උතුරට*: කැබලි අංක 742 1/2 සහ 331; *නැගෙනහිරට*: කැබලි අංක 331 සහ 744; *දකුණට*: කැබලි අංක 744 සහ 331; *බටහිරට*: කැබලි අංක 331 සහ 742 1/2.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් ඇති සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2017.08.29 දින

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 25916 - 37 (2017/07)

පෙ. ව. 10.00 ට කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 අගෝස්තු මස 22 වැනි දිනට මත්තෙන් ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2017 ජූලි මස 17 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 105

## නිවැරදි කිරීමයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම.

2017 ජුනි මස 07 වැනි දින අංක 2022/19 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ වූ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් අත්පත් කරගැනීමේ දැන්වීමෙහි අනු අංක 09හි කැබලි අංකය 485 ලෙස පළවූයේ මුද්‍රණ දෝෂයකිනි. එම අනු අංක 09 යටතේ “කැබලි අංකය 486” ලෙස නිවැරදි විය යුතු ය.

ප්‍රාදේශීය ලේකම් (*වැ. බ*),
මැදිරිගිරිය.

2017 ජූලි මස 13 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-106

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.